# බස්නාහිර පළාතේ පළාත් සභා රැස්වීම

## 2018 ජූලි මස 17 වන අඟහරුවාදා

**බත්තරමුල්ල, ශ්‍රී ජයවර්ධනපුර, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවතේ, අංක 204 හි පිහිටි**

**බස්නාහිර පළාත් සභා ගොඩනැගිලි සංකීර්ණයේ සභා ශාලාවේදී පවත්වන ලද රැස්වීම**

පූ.භා. 09.35 ට සභාව රැස් විය. ගරු සභාපතිතුමා මූලාසනාරූඪ විය.

- **පැමිණීම :**

ගරු සුනිල් විජේරත්න (සභාපතිතුමා)

ගරු යසපාල කෝරලගේ (නියෝජ්‍ය සභාපතිතුමා)

ගරු ඉසුර දේවප්‍රිය (බස්නාහිර පළාතේ ප්‍රධාන අමාත්‍ය, මුදල් හා ක්‍රමසම්පාදන, ඉංජිනේරු සේවා, නීතිය හා සාමය, පළාත් පාලන හා පළාත් පරිපාලන, ආර්ථික ප්‍රවර්ධන, විදුලිබල හා බලශක්ති, පරිසර කටයුතු, ජලසම්පාදන හා ජලාපවාහන සහ සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍යතුමා)

ගරු ගාමිණී තිලකසිරි (බස්නාහිර පළාතේ කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග, ධීවර, සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සහ ගොවිජන සංවර්ධන අමාත්‍යතුමා)

ගරු රංජිත් සෝමවංශ (බස්නාහිර පළාතේ අධ්‍යාපන, සංස්කෘතික හා කලා කටයුතු, ක්‍රීඩා හා යෞවන කටයුතු සහ තොරතුරු තාක්ෂණ පිළිබඳ අමාත්‍යතුමා)

ගරු ලලිත් වනිගරත්න (බස්නාහිර පළාතේ මාර්ග, ප්‍රවාහන, සමූපකාර සංවර්ධන හා වෙළඳ, නිවාස හා ඉදි කිරීම්, වතු යටිතල පහසුකම්, කර්මාන්ත හා ග්‍රාම සංවර්ධන අමාත්‍යතුමා)

ගරු සුමිත් ලාල් මැන්දිස් (බස්නාහිර පළාතේ සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුභ සාධන, පරිවාස හා ළමාරක්ෂක සේවා, කාන්තා කටයුතු සහ සභා කටයුතු පිළිබඳ අමාත්‍යතුමා)

ගරු හෙක්ටර් බෙත්මගේ (සභා නායකතුමා)

ගරු චන්දන ජයකොඩි (ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා)

ගරු යූ. ජෝර්ජ් පෙරේරා (විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා)

**ගරු මන්ත්‍රීවරු**

අනුරුද්ධ ලේකම්ගේ
අසෝක රන්වල
අමල් සිල්වා
ඇන්ටනී උපුල් රාජිත
ඉෆ්තිකාර් ජෙමීල් මරික්කාර්
ඊ.ඒ. නන්දන පත්මකුමාර
උදාර රත්නායක
උදේන විජේරත්න
උපාලි කොඩිකාර
උපාලි ගුණරත්න
උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ
එම්.එස්.එම්. රහීම්
එස්.ඒ. සමන්මලී සකලසූරිය මැතිනිය
එස්. කුහවර්ධන්
එස්.එම්. සකාවුල්ලා
ඕ.ඩබ්ලිව්. ප්‍රසන්න සංජීව
කිත්සිරි කහටපිටිය
කිත්සිරි මංචනායක
කීර්ති කාරියවසම්
කුරුසාමි කලන්කාඩි තේවර්
ක්‍රිෂාන්ත යෝගදාස් පංචරත්නම් රාම්
කේ.ඩී. අරුණ දීපාල්
ගුණසිරි ජයනාත්
ජගත් අංගගේ
ජගත් කුමාර
ජගත් පී. විතාන
ජනක කුරුප්පු
ජනක දීපාල් වැලිවත්ත
ජයන්ත ද සිල්වා
ඩී.ඩබ්ලිව්. පුෂ්පකුමාර ද සිල්වා
ඩෝල්ටන් ජානක සූරියබණ්ඩාර
තුවාන් ආමිත් මොහමඩ් අක්රම්
නිමල් චන්ද්‍රරත්න
නිරෝෂ් ඩිල්ෂාන් ජයවර්ධන
නිරෝෂන් පාදුක්ක
නිරෝෂා අතුකෝරල මැතිනිය
නිශාන්ත ශ්‍රී වර්ණසිංහ
නීල් සුනේත්‍රලාල් ප්‍රනාන්දු
පී.ආර්.පී. අබේගුණවර්ධන
පී.ඩී. අබේරත්න
ප්‍රදීප් උඳුගොඩ
ප්‍රදීප් පෙරේරා
බී.පී. ලක්ෂ්මන් ගුණවර්ධන
මල්ෂා කුමාරණතුංග මැතිනිය
මහේෂ් අල්මේදා
මංජුල බුද්ධදාස
මෙරිල් පෙරේරා
මොහොමඩ් ෆායිස්
යූ.එල්.එන්.පී. උඩවෙල
රවීන්ද්‍ර යසස් කුමානායක
රොජර් සෙනෙවිරත්න
රොඩ්නි රුඩෝල්ෆ් ෆ්‍රේසර්
රෝස් ප්‍රනාන්දු මෙනෙවිය
ලක්ෂ්මන් නිපුණ ආරච්චි
ලලන්ත ගුණසේකර
ලලිත් එල්ලාවල
ලලිත් වර්ණකුමාර
ලෙනාඩ් කරුණාරත්න
සරත් පතිරණ
සලෝචන ගමගේ
සහන් ප්‍රදීප්
සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා
සුනිල් ජයමිණි
සුනිල් වටගල
සුමිත් විජයමුණි ද සොයිසා
සුසිල් කිඳෙල්පිටිය
ශිරන්ත අමරසේකර
ශ්‍රීනාත් පෙරේරා
හරිස්චන්ද්‍ර කොස්තා

**නොපැමිණීම :**

ගරු ලාලන් සුදත් මංජු ශ්‍රී අරංගල (විපක්ෂ නායකතුමා)

**ගරු මන්ත්‍රීවරු**

අනන්ද හරිස්චන්ද්‍ර ද සිල්වා
අනුරාධ විමලරත්න
අර්ෂාඩ් නිසාම්ඩීන්
ඇ. ශ්‍රීනාත් ම. පෙරේරා
ඉන්දික බණ්ඩාර
කාමල් කුරුප්පු
කොලන්නගේ වජිර පෙරේරා
කෝකිලා හර්ෂනී ගුණවර්ධන මැතිනිය
ගමගේ නිහාල් ප්‍රේමශාන්ත පෙරේරා
චන්ද්‍රසෝම සරණලාල්
තෙබුවන පියනන්ද හිමි
නව්සර් ෆව්සි
නිමල් ආර්. පීරිස්
මහින්ද ජයසිංහ
මොරිස් විජේරත්න
මොහොමඩ් ෆයිරූස්
රජිත හපුආරච්චිගේ
රන්දීර් රොද්‍රිගෝ
රවී විජේසේකර
ලයනල් ජයසිංහ
විජිත් ප්‍රියන්ත
සන්ධ්‍යා සිරිවර්ධන මැතිනිය
සුසාර දිනාල්
සෙනල් වෙල්ගම

## 01. සභාපතිවරයාගේ නිවේදන :

*i*

*"ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් 2018 ජූලි මස 12 වන දින පෙ.ව. 9.00 ට යෙදුණු සුභ මොහොතින් නව සභා ශාලාව ඇතුළු නව බස්නාහිර පළාත් සභා ගොඩනැගිලි සංකීර්ණය විවෘත වූ වග ගරු මන්ත්‍රීවරුන්ට ඉතාමත් ගෞරවයෙන් දැනුම් දෙන බවත්, එමෙන්ම නව සභා ශාලාවේදී තවදුරටත් ලබා දිය යුතු අවශ්‍ය පහසුකම් සම්පූර්ණ වූ විගස නව සභා ශාලාව තුළ රැස්වීම් පවත්වන්නට යථා කාලයේදී හැකියාව ලැබෙන බවත්, ඒ සඳහා අදාළ අංශ මා වෙත දැනුම් දුන් පරිදි ඔබතුමන්ලා වෙත ඒ බව දැනුම් දෙන බවත් ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී."*

*ii*

*"ගරු පළාත් සභා මන්ත්‍රී මහේෂ් අල්මේදා මැතිතුමාව අද දින සිට ක්‍රියාත්මක වන පරිදි සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුභ සාධන, පරිවාස හා ළමා රක්ෂක සේවා, කාන්තා කටයුතු සහ සභා කටයුතු පිළිබඳ අමාත්‍යාංශය උපදේශක කාරක සභාවේ සාමාජිකයෙකු වශයෙන් ද,*

*ගරු පළාත් සභා මන්ත්‍රී ඩෝල්ටන් ජානක මැතිතුමාව හා ගරු පළාත් සභා මන්ත්‍රී රෝහණ අබේගුණවර්ධන මැතිතුමාව අද දින සිට ක්‍රියාත්මක වන පරිදි සභා කටයුතු කාරක සභාවේ සාමාජිකයන් වශයෙන් ද,*

*නම් කරන ලද බව ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී."*

## 02. නොපැමිණ සිටීමේ අවසරය :

*"විජිත් ප්‍රියන්ත ද සිල්වා ගරු මන්ත්‍රීතුමාට මාස තුනක කාලයක් රැස්වීම්වලට නොපැමිණ සිටීමට අවසර දිය යුතු යැයි යූ. ජෝර්ජ් පෙරේරා විපක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායකතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව සභා සම්මත විය."*

## 03. කාරක සභා වාර්තා :

ගරු සභාපතිතුමා විසින් 2018.06.28 හා 2018.07.04 හා දිනවල පැවති සභා කටයුතු පිළිබඳ කාරක සභා වාර්තාව පිළිගන්වන ලදී.

## 04. පළාත් සභාවේ කටයුතු :

ඉසුර දේවප්‍රිය ගරු ප්‍රධාන අමාත්‍යතුමා විසින් ඉදිරිපත් කරන ලද පහත සඳහන් යෝජනාව සභා සම්මත විය.

*"අද දින (2018.07.17 දින) සභා න්‍යාය පත්‍රයේ සඳහන් පොදු කටයුතු විෂයයේ වැඩ කටයුතු සඳහා කාර්ය පටිපාටි රීති අංක 39(1), 39(3) හා 52(5) හි සඳහන් විධිවිධානයන්ගෙන් කිනම් හෝ බාධාවක් සිදු නොවිය යුතුය."*

## 05. 2018 පරිපූරක ඇස්තමේන්තුව - 02

ඉසුර දේවප්‍රිය ගරු ප්‍රධාන අමාත්‍යතුමා විසින් පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරන ලදී.

*"2018 වර්ෂය සඳහා බස්නාහිර පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය වෙත මතු දැක්වෙන අවශ්‍යතා වෙනුවෙන් එනම්,*

*පළාත තුළ වැඩ අවසන් නොකළ පාසල් ගොඩනැගිලිවල වැඩ අවසන් කිරීම, අත්‍යවශ්‍ය පාසල් ගොඩනැගිලි ඉදි කිරීම් ඇතුළු අනෙකුත් ඉදිකිරීම් හා අධ්‍යාපන ක්ෂේත්‍රයේ අවශ්‍යතා වෙනුවෙන් ප්‍රතිපාදන වෙන් කිරීම*

*(රුපියල් මිලියන හත්සිය පනහක් - රු. 750,000,0000) යන අවශ්‍යතා වෙනුවෙන් 2018 වර්ෂය සඳහා පරිපූරක ඇස්තමේන්තුවක් ඉදිරිපත් කළ යුතුව ඇති හෙයින්, ඒ සඳහා අවශ්‍ය රුපියල් මිලියන හත්සිය පනහක් වන (රු. 750,000,000) මුළු ප්‍රතිපාදනය දැනට භාණ්ඩාගාර රිපෝ යටතේ ආයෝජනය කර ඇති මුදලින් කොටසක් ලබා ගැනීම මගින් පියවා ගැනීමට අපේක්ෂිත වන හෙයින් ඒ අනුව පිළියෙල කරන ලද 2018 පරිපූරක ඇස්තමේන්තුව - 02 අනුමත කළ යුතුය."*

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***

***එවලේ ගරු මන්ත්‍රීවරුන් විසින් පරිපූරක ඇස්තමේන්තුවට අදාළව ඉදිරිපත් වූ ව්‍යාපෘතින්වලට වෙන් වූ මූල්‍ය ප්‍රතිපාදන සම්බන්ධයෙන් සංශෝධන ඉදිරිපත් කරන ලදුව, පරිපූරකයෙන් යෝජිත මුදල වන රු. 750,000,000 ක මුදල සංශෝධනය නොවිය යුතු බවත්, ඉදිරිපත් කරන ලද ව්‍යාපෘති සම්බන්ධයෙන් ඉදිරිපත් වූ සංශෝධන, එනම් එකී මුදල ඇතුළත ව්‍යාපෘති සම්බන්ධයෙන් පමණක් සංශෝධන කිරීමට විරෝධතාවයක් නොමැති බව ගරු ප්‍රධාන අමාත්‍යතුමා ප්‍රකාශ කරන ලදී.***

***අනතුරුව, ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***

## 06. 2018 පරිපූරක ඇස්තමේන්තුව - 02 ට අදාළ විසර්ජන ප්‍රඥප්තිය

ඉසුර දේවප්‍රිය ගරු ප්‍රධාන අමාත්‍යතුමා විසින් ඉදිරිපත් කරන ලද පහත සඳහන් යෝජනාව සභා සම්මත විය.

*"2018 වර්ෂයේ පරිපූරක ඇස්තමේන්තුව - 02 සඳහා අවශ්‍ය රුපියල් මිලියන හත්සිය පනහක් (රු. 750,000,000) වූ මුදල බස්නාහිර පළාත් සභා අරමුදලින් ගෙවීමටත්, එකී බස්නාහිර පළාත් සභා අරමුදලට, ශ්‍රී ලංකා ආණ්ඩුවෙන් ප්‍රදාන වශයෙන් හෝ වෙනත් ආකාරයකින් ලැබෙන මුදල් භාර ගැනීමටත් බලය දෙනු ලබන 2018 අංක ........ දරන විසර්ජන ප්‍රඥප්තිය අනුමත කළ යුතුය."*

## 07. රීති අංක 110 යටතේ යෝජනාව :

නිශාන්ත ශ්‍රී වර්ණසිංහ ගරු මන්ත්‍රීතුමා විසින් ඉදිරිපත් කරන කරන ලදුව, යූ. ජෝර්ජ් පෙරේරා විපක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායකතුමා විසින් ස්ථිර කරන ලද පහත සඳහන් යෝජනාව සභා සම්මත විය.

*"පොදු වැදගත්කමකින් යුක්ත වූද, කාලීන වූද බැවින් පහත සඳහන් යෝජනාව සභාවට ගෙන ඒම සඳහා කාර්ය පටිපාටි රීති 14(6), 14(7) (ආ), 19(1), 19(3), 39, 53(2), 53(3) යන රීති අත්හිටුවිය යුතු බවට යෝජනා කර සිටියි."*

## 08. පෞද්ගලික මන්ත්‍රී යෝජනාව :

නිශාන්ත ශ්‍රී වර්ණසිංහ ගරු මන්ත්‍රීතුමා විසින් ඉදිරිපත් කරන කරන ලද පහත සඳහන් යෝජනාව යූ. ජෝර්ජ් පෙරේරා විපක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායකතුමා විසින් ස්ථිර කරන ලදී.

*"ගෙවී ගිය කාලය තුළ මහාපරිමාණ මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවන්ගේ ක්‍රියාකාරීත්වය ඉහළ ගොස් ඇති අතර මත්කුඩු රට තුළට ගෙන ඒමද, බෙදා හැරීමද වැඩි වී ඇත. නීතියේ රැහැනට හසුව සිරගත කර සිටින ජීවිතාන්තය දක්වා මරණ දඬුවම නියමව සිටින මෙම මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවන් බන්ධනාගාර තුළ සිට ද, මත්ද්‍රව්‍ය ජාවාරම මෙහෙයවමින් රට තුළට මත් කුඩු කන්ටේනර් පිටින් ගෙන එමින් දේශීය වශයෙන් පමණක් නොව විදේශීය වශයෙන්ද මත්ද්‍රව්‍ය බෙදා හරින කේන්ද්‍රස්ථානයක් බවට ශ්‍රී ලංකාව පත් කර ගෙන ඇත. බන්ධනාගාර පරිපාලනය බිඳ වැටීම හා ආකාර්යක්ෂම වීම මෙයට හේතුව වී ඇත. එබැවින් මෙම අපරාධකරුවන්ට එරෙහිව රටේ නීතියේ ස්වෛරීත්වය ආරක්ෂා කර ගනිමින් නීතිය උපරිම ලෙස ක්‍රියාත්මක*

*කර බලාත්මක කරන ලෙසත් මරණීය දණ්ඩනය රටේ නීතියේ කොටසක් බැවින් එය ක්‍රියාත්මක කිරීමට කටයුතු කරන ලෙසත් රජයෙන් ඉල්ලා සිටී."*

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***

***පූ.භා. 10.47 ට ගරු සභාපතිතුමා [සුනිල් විජේරත්න මහතා] මූලාසනයෙන් ඉවත් වූයෙන් ගරු නියෝජ්‍ය සභාපතිතුමා [යසපාල කෝරළගේ මහතා] මූලාසනාරූඪ විය.***

***පූ.භා. 11.49 ට ගරු නියෝජ්‍ය සභාපතිතුමා [යසපාල කෝරළගේ මහතා] මූලාසනයෙන් ඉවත් වූයෙන් ලලිත් එල්ලාවල ගරු මන්ත්‍රීතුමා මූලාසනාරූඪ විය.***

***අ.භා. 12.59 ට මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා [ලලිත් එල්ලාවල මහතා] මූලාසනයෙන් ඉවත් වූයෙන් ගරු නියෝජ්‍ය සභාපතිතුමා [යසපාල කෝරළගේ මහතා] මූලාසනාරූඪ විය.***

***අනතුරුව, ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***

## 09. කල් තැබීම :

ගරු නියෝජ්‍ය සභාපතිතුමා විසින් පළාත් සභාව කල් තබන ලදී.

***ඊට අනුකූලව, පළාත් සභාව අ.භා. 02.16 ට, 2018 අගෝස්තු මස 07 වන දින පෙ.ව. 9.30 වන තෙක් කල් ගියේය.***

හේමන්ත සමරකෝන්,
ලේකම්,
බස්නාහිර පළාතේ පළාත් සභාව.

2018.07.14
බස්නාහිර පළාතේ පළාත් සභාව,
5 වන මහල,
බී පර්යන්තය,
සෙත්සිරිපාය,
බත්තරමුල්ල.

අච/17
Minuts 2018.07.17 - Hansard Section